පොඩිකාලේ ඉඳලම අරමුණු ගොඩක් හිතේ තියාගෙනයි මම ඉගෙන ගත්තේ ඒ හින්දම අගහිඟකම්, දුක්කම්කටොලු විඳදරාගෙන ලැබෙන දෙයින් සතුටුවෙන්න පුරුදු උනා. ශ්‍රියානි ඇයගේ කථාව ආරම්භ කළේ එහෙමයි. ශ්‍රියානි ජීවත්වන්නේ වැලිකන්ද, සිංහපුර, දිඹුලාන ගම්මානයේ. ඇය මූලික අධ්‍යාපනය ලැබුවේ සිංහපුර කණිෂ්ඨ විද්‍යාලයෙන්. වැලිකන්ද ප්‍රදේශයේ ජීවත්වන බහුතරයක් ගැමියන් මෙන්ම ශ්‍රියානිලාගේ පවුල ද දුප්පත්කම උරුම කරගත්තක්. මුදල් තියෙන පවුල් කිහිපයක් මේ ප්‍රදේශයේ ජීවත් වුනද ඔවුන්ගේ ජීවිත හා අනෙකුත් ගැමියන්ගේ ජීවිත අතර ලොකු වෙනසක් මේ ප්‍රදේශවල තිබුනේ නැහැ. දෙපැත්තක යුද්ධයේ මැද සිටුවා ඇති මිනිස් පවුරක මිනිසුන්ගේ ඛේදාන්තය අමුතුවෙන් කිව යුතුද ? එක් පැත්තක යුද්ධය, අනෙක් පස වල් අලි ඇතුලු වනසතුන් ඔවුන්ගේ ජීවිත වලට තර්ජනය ගෙන දෙයි. ඒ විතරක් ද මිනිස්සුන්ට අත්‍යවශ්‍යම ''වතුර'' ඔවුන් එදිනෙදා මුහුණ දෙන ලොකුම ගැටළුවයි. අප වැලිකන්දට ගිය හැම වෙලාවකම ඔවුන් අපෙන් ඉල්ලුවේ කෙසේ හෝ අපිට වතුර ලබා දෙන ලෙසයි.

බලධාරීන්ට කණ්නලවු කරල ඇතිවෙලා ඉන්න ඔවුන් දැන් පිදුරු ගහෙත් එල්ලෙන්නයි බලාන ඉන්නේ. ''මේ ගමෙන් එගොඩට කිසිකෙනෙක් එන්නේ නැහැ මහත්තයා, නිළධාරීන්, දේශපාලකයන් තියා අඩුම තරමේ මේ පළාතේ ඉන්න පත්තරකාරයෝවත් මෙහේට එන්නේ නැහැ. අපිව මේ රටට අයිති නැහැ මහත්තයා ''ඒකයි ඒ'' මට හමුවුන වයසක තාත්තා කෙනෙක් කියාගෙන යනවා.

ශ්‍රියානි ගැහැණු ළමයි තිදෙනෙකුගෙන් යුතු පවුලක දෙවැනියා. කුඩා කළ සිටම ශ්‍රියානි හිතුවේ හොඳට ඉගෙන ගෙන ගුරුවරියක් වී තම මව් පියා ඇතුළු සහෝදරියන්ව රැක බලා ගන්නේ කෙසේද? කියායි. එහෙත් ඇගේ ඒ සිහින මේ රටේ අධ්‍යාපන බලධාරීන් විසින් ඛේදනීය ලෙස බොඳ කර දාලා. ඇය විශ්ව විද්‍යාලයට යන්න ඉහලින්ම පාස් උනත් ඇයව විශ්ව විද්‍යාලයට අරගෙන නැහැ. ''මම මුලින්ම ඉස්කෝලේ ගියේ වැලිකන්ද සිංහපුර කණිෂ්ඨ විද්‍යාලයට. අපේ ඉස්කෝලේ තිබුණේ අ.පො.ස. සා/පෙළ දක්වා විතරයි. පහ හය පන්ති වලදී ළමයි 30-35 විතර හිටියා ඒත් සා/පෙළ වෙත කොට හිටියේ ළමයි 10 දෙනයි. මෙහේ දුප්පත් කමයි යුද්ධෙයි නිසයි හුගක් ළමයි වැඩි දුර ඉගෙන ගන්නේ නැහැ. එයිනුත් ගැහැණු ළමයි අවුරුදු 13-14 වෙනකොට කසාද බඳිනවා.

මමයි තව ළමයෙකුයි විතරයි මුළු වැලිකන්දෙන්ම සාමාන්‍ය පෙළ සමත් උනේ. අදටත් වෙන කිසිම කෙනෙක් අපේ ඉස්කෝලෙන් සා/පෙළ පාස් වෙලා නැහැ. අපිට උගන්වන්න ගුරුවරු හිටියේ නැහැ මොකද යුද්දේ නිසා කවුරුත් මෙහේ ඉන්නේ නැහැ. විෂයන් හතෙන් හතරක්ම ඉගෙන ගන්නේ තනිවම පොත් කියවල. අපිට රෑට ලාම්පු පත්තු කරන්න අවසර තිබුනේ නැහැ. ඒ විතරද රෑට ගෙදර අනෙක් අය එක්ක නිදියගන්න කැලේට යන්න ඕන. මොකද එල්.ටී.ටී.ඊ. එකෙන් ගහයි කියලා ගමේ කවුරුවත් රෑට ගෙවල් ඇතුලේ ඉන්නේ නැහැ. අපි පොඩි කාලේ ඉඳලම වැස්සට, පින්නට වගේම කැලෑ සත්තුන්ගෙන් බැට කාල ඉන්නේ. ඉගෙන ගන්න සුදුසු පරිසරයක් තිබුනේ නැහැ. ඒත් මෙහේ අනෙක් අය වගේ මම ඉස්කෝලේ ගමන අත් හැරියේ නැහැ. සා/පෙළ පාස් වුනාට පස්සේ උසස් පෙළ ඉගෙන ගන්න පොලොන්නරුවට යන්න ඕන. මං හුගක් ආශාවෙන් හිටිය පොළොන්නරුව තෝපාවැව මහ විද්‍යාලයට යන්න ඒත් අපිට කොහෙන්ද සල්ලි.

පොලොන්නරුවේ නැවතිලා ඉගෙන ගන්න? ඇයි ඔයාට වැලිකන්දේ ඉඳලා පොලොන්නරුවට ගිහින් ඉගෙන ගන්න බැරිද?

මගේ ඒ ප්‍රශ්නෙත් එක්ක ඇයගේ අධිෂ්ඨානයෙන් පිරි ඇස් වලට කඳුළු උනනවා පෙනුනා එහෙත් ඇය ඒ කඳුළුවලට එළියට එන්න ඉඩ දුන්නේ නැහැ.

''මෙහේ ඉඳල පොලොන්නරුව යන්න පැය තුනක් විතර යනවා. ඒ විතරක් ද රුපියල් 150-200 විතර ඕන ගිහිං එන්න. ඒ සියල්ල පැත්තකට දාමු ඉස්කෝලේ පටන් ගන්න කලින් යන්න කෝ බස්? මෙහේ උදේන්ම බස් නැහැ. සමහර දවස්වලට තියෙන බස් වැඩ කරන්නෙත් නැහැ. මට උගන්නන්න අම්මටයි තාත්තටයි සල්ලිත් නැහැ. මගේ බලාපොරොත්තු මුලින්ම නැති වෙන්න ගියේ එහෙමයි. ඒත් මගේ අක්ක මට උගන්වන්න රස්සාවකට යන්න තීරණය කළා. අක්ක අදත් කටුනායක ගාමන්ට් එකක දුක් විඳිනවා පොළොන්නරුවේ නැවතිලා ඉගෙන ගන්න සල්ලි නැති නිසා දෙහි අත්ත කණ්ඩියේ ඉන්න අපේ නැන්දා කෙනෙකුගේ ගෙදර ඉඳලා ඒහේ ඉස්කොලෙට යන්න මම හිත හදා ගත්තා. ඒ ඉස්කෝලෙන් උසස් පෙළ තිබිලා තිබුණේ නැහැ. මගේ වාසනාවට මං යන අවුරුද්දෙම ඒ ඉස්කෝලේ උසස් පෙළ පංති පටන් ගත්තා. අපි තමයි ඒ ඉස්කෝලේ පළමුවන උසස් පෙළ ළමයි කණ්ඩායම. වැලිකන්දට වඩා ආරක්ෂාවක් එහේ තිබුණා. ඒත් දුක්කම්කටොළු වල අඩුවක් තිබුනේ නැහැ. මං හුගක් මහන්සි වුනා. අපිට ටියුෂන් පන්ති තිබුනේ නැහැ. අන්තිමට මගේ අක්කගේ දුක් කඳුළු වලට වටිනාකමක් දෙන්න මට පුලුවන් උනා. මම A-2, B-1 එක්ක ඉහලින්ම උසස් පෙළ පාස් උනා. මට තමයි ඒ ඉස්කෝලේ හොඳම ප්‍රතිඵල තිබුනේ.

ඇය බලාපොරොත්තු පොදි බැඳගෙන විශ්ව විද්‍යාලයට යාමට ලැස්ති උනා. ඇයගේ විශ්ව විද්‍යාල අයදුම්පත ලැබුන බව සඳහන් ලිපියක් විශ්ව විද්‍යාල ප්‍රතිපාදක කොමිසමෙන් ඇයට ලැබුනා. ඇගේ සතුට නිම්හිම් නැති උනා. ඒත් ඇයගේ අක්ක ගැන මතක් වෙන කොට ඇයට බය හිතුනා. ඇයට පුලුවන් ද තවත් දුක් විඳින්න. ඒත් අක්කගේ අධිෂ්ඨානය කෙසේ හෝ තම නංගිට උගන්නන්නයි. ඒ නිසා නංගිට විශ්ව විද්‍යාලයට යන්න සූදානම් වෙන්න කියා අක්කයි, අම්මයි තාත්තයි උනන්දු කරා. එහෙත් ඊට පසු වසර තුනක් ගතවූනා තවම ඇයට විශ්ව විද්‍යාලයට යන්න ලියුම් ආවේ නැහැ. ''මං හැමදාම ලියුම් කාරයා එනකොට මග බලන් ඉන්නවා. ඒත් විශ්ව විද්‍යාලයෙන් ලියුම් ආවේ නැහැ.

ඒ අතර මට ආරංචි වුණා විද්‍යාපීඨ සඳහා ළමුන් බඳවා ගන්නව කියලා. මං අයදුම් පතක් දැම්මා ඉන්පසු මාව සම්මුඛ පරීක්ෂණ දෙකකට කැදෙව්වා. එහිදි ඔවුන් කිවුවා මං මගේ ෆෝර්ම් එක පුරවලා තියෙන්නේ වැරදියට කියල. මම මගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය ලෙස ෆෝර්ම් එකේ අම්පාර සඳහන් කිරීම කියලා ඔවුන් දැනුම් දුන්නා. මම උසස් පෙළ ලිව්ව දෙහිඅත්තකණ්ඩිය අයිති අම්පාර දිස්තික්කයට ඒ නිසා මම හිතුවේ ස්ථිර පදිංචි ලිපිනය විය යුත්තේ  අම්පාර කියලායි. එතකොට තමයි මට මතක් උනේ මම විශ්ව විද්‍යාල අයදුම් පත්‍රය පිරවුවෙත් එසේමයි කියා. මං අතින් වැරද්දක් උනා තමයි ඒත් මට දිස්ත්‍රික්ක දෙකෙන්ම විශ්ව විද්‍යාලයට යන්න **Z-Score** ලකුණු තිබුණා. ඒ වැරද්ද නිවැරදි කරලා හරි මාව විශ්ව විද්‍යාලයට ගන්න තිබුනා අඩුම වශයෙන් මං ජීවත්වන ප්‍රදේශය ගැන හරි සලකලා ඒක කරන්න තිබුණා. මටවත් අපේ පළාතේ අනෙක් කාටත් මේ වගේ ෆෝම් පුරවන්න අවබෝධය හා අත්දැකීම් තිබුනේ නැහැ මොකද මේ පලාත් වල ඉන්න මිනිස්සු ජීවත් වෙන්න පොලොවක් එක්ක ඔට්ටු වෙන අය.

මම විශ්ව විද්‍යාලයට යන එක අත්හරින්න තීරණය කරලා විද්‍යාපීඨ යන්න හිත හදාගත්ත නිසා ඔවුන්ගෙන් නැවත ඉල්ලීමක් කළ වැරද්ද නිවැරදි කරලා මාව ඇතුලත් කරගන්නා ලෙස. එවිට ඔවුන් දැනුම් දුන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයට ගොස් විද්‍යාපීඨ බාර අධ්‍යක්ෂකවරිය මුණ ගැසෙන ලෙසයි. මං කොළඹ ගිහින් ඇයව මුණ ගැසී මේ කාරණය කිවුවාම සොයා බලා දැනුම් දෙන්නම් කිවුවා. එහෙත් ඒ පිළිබඳ පිළිතුරක් ලැබුනේ නැහැ. පස්සේ මම අපේ ඉස්කෝලේ විදුහල්පතිතුමා සමඟ නැවතවරක් අමාත්‍යාංශයට ගියා ඒත් උත්තරය උනේ සොයා බලා දැනුම් දෙන්නම් කියලා. අද වෙනකම් ඒ දැනම් දීම හම්බ වුනේ  නැහැ. මොකද අපි වැලිකන්දේ නිසා අපිව ලෙහෙසියෙන් අත් ඇරලා දානවා. අපිට සටන් කරන්න හයිය නැහැනේ. අපි වෙනුවෙන් කථාකරන්නත් කවුරුත් නැහැ. අපි කොන් වෙච්ච මිනිස්සුනේ.

ඇත්ත ඔවුන් මේ රටට අයිති නැති මිනිස්සු කියලා මටත් හිතෙනවා ඒ නිසා තමයි ඔවුන්ට මේ විදිහට සලකන්නේ. යුද්ධයේ කුරිරු අත්දැකීම් ඔවුන්ව වෙලාගෙන, ඒ විතරක් ද දුප්පත්කම, ස්වභාවධර්මය මේ සියලු දෙනාගේ කුරිරුකම් වලින් මේ මිනිස්සු බැට කනවා.

එහෙත් මේ මිනිස්සු මෙහෙට වෙලා දුක තමන්ගේ උරුමය කියලා හිතනවා. දිඹුලාන ඉස්කෝලේ අද ඉන්නේ එක් ගුරුවරියකුයි විදුහල්පතිතුමයි විතරයි. ගුරුවරියත් ස්වේච්ඡා ගුරුවරියක්. එහෙත් ඒ ගමේ දැරියකට ගුරුවරියක් වීමේ අයිතිය උදුරගෙන. මේ මිනිසුන්ව බොහෝම ලෙහෙසියෙන් අමතක කරන්න පුලුවන් මන්ද අපි හැමෝම හිතන් ඉන්නේ දුක ඔවුන්ගේ කරුමය කියලනේ. ශ්‍රියානි ඉන් පස්සේ කළේ මේ අසාධාරණය පිළිබඳව ජනාධිපතිට ලියපු එකයි. එහෙන් ලිපියක් ලැබුණා ඒ එවකට උසස් අධ්‍යාපන නියෝජ්‍ය ඇමති නිර්මල කොතලාවල මහතාට මේ දැරිවි ගැන සොයා බලා සාධාරණය ඉටුකරන ලෙස ඉල්ලා යැවූ ලිපියක පිටපතක්. එහෙත් තවම ඇයට සාධාරණය ඉටුවී නැහැ.

ගරු ජනාධිපතිතුමනි. අධ්‍යාපන ඇමතිතුමනි විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපතිතුමනි විශ්ව විද්‍යාලයට යෑමට සියලු සුදුසුකම් තිබු මේ දැරියට එය අහිමි වුයේ පදිංචි දිස්ත්‍රික්කය වැරදීම නිසාද? එය මකා දමා හෝ නැවත අයදුම් පතක් ගෙන්වා ගෙන හෝ මේ තරුණියව විශ්ව විද්‍යාලයට ගන්න යුතුකමක් අදාල නිලධාරීන්ට නොසිතුනේ මන්ද? මෙවන් දුප්පත් දරුවන්ට මේ රටේ ඇති එකම අවස්ථාව ඉගෙන ගැනීම නොවන්නේ ද? ගුරුවරු රැකියාවට නොයන ඇගේ ප්‍රදේශයේ දරුවන්ට ඉගෙන්වීමට ඇයට හෝ අවස්ථාව නොදෙන්නේ වැලිකන්දේ ඊළඟ පරම්පරාවන් නුගත් කමේ ගිල්ලවත්නට ද? නො එසේනම් ඔවුන් අධ්‍යාපනය ලබා ලෝකය පිළිබඳව අවබෝධ වූ විට මේ රටේ බලධාරීන් ලෙස ඔබලා ඔවුන්ට කළ අසාධාරණය ඔවුන් තේරුම් ගත්හ නිසාද? මේ අහිංසක දැරිය වෙනුවට කාගේ හෝ හෙංචයියෙකුගේ නුසුදුසු කෙනෙකු අද විශ්ව විද්‍යාලය තුළ ඉගෙන ගන්නා බවද අපි දනිමු ඇයට ඔබලා සාධාරණය ඉටු කරන තෙක් අපි බලා හිඳිමු. එසේම මේ රටේ තවත් දුප්පත් දරුවන්ගේ ජීවිත බලධාරීන්ගේ හෝ ක්‍රමයේ වරද නිසා මෙලෙස අනාත වන්නට ඉඩ දෙමු ද? ශ්‍රියානි තවම බලන් ඉන්නම් ඇයට සාධාරණය ඉටු කරන තුරු. අපි ඇයට එසේ ඉන්නට ඉඩ හරිමු ද? නැත්නම් ඇය වෙනුවෙන් යමක් කරමු ද?

**රසික මනෝබුද්ධි**